සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 10
විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව
පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## ගෘහ ආර්ථික විද්‍යාව I

| | | | |
|---|---|---|---|
| (1) 3 | (11) 4 | (21) 1 | (31) 3 |
| (2) 1 | (12) 3 | (22) 1 | (32) 4 |
| (3) 3 | (13) 2 | (23) 1 | (33) 2 |
| (4) 4 | (14) 4 | (24) 2 | (34) 3 |
| (5) 3 | (15) 1 | (25) 2 | (35) 3 |
| (6) 1 | (16) 3 | (26) 3 | (36) 2 |
| (7) 2 | (17) 2 | (27) 1 | (37) 1 |
| (8) 3 | (18) 1 | (28) 4 | (38) 4 |
| (9) 4 | (19) 4 | (29) 3 | (39) 1 |
| (10) 2 | (20) 1 | (30) 2 | (40) 2 |

එක් පිළිතුරකට ලකුණු 01 බැගින්
මුළු ලකුණු 1 × 40 = 40

## ගෘහ ආර්ථික විද්‍යාව II

(01) (1)
- අඩු බර දරු උපත් ඇති වීම.
- මන්ද මානසික දරුවන් ඇති වීම.
- මන්ද බුද්ධික දරුවන් ඇතිවීම.
- සංජානීය ආබාධ සහිත දරුවන් ඇතිවීම.
- ගබ්සාවීම් සිදු වීම.
- මළදරු උපත් ඇතිවීම (ලකුණු 02)

(2) මුං ඇට, කඩල, කවුපි, උදු වැනි මාෂ භෝග සහිත ආහාර වේලක් (ආහාර නම් කිරීම ප්‍රමාණවත්) (ලකුණු 02)

(3) කැල්සියම් (ලකුණු 02)

(4) අන්‍යෝන්‍ය බැඳීම, සහයෝගය, සුරක්ෂිතභාවය, බෙදා හදා ගැනීම, ත්‍යාගශීලි බව, පරාර්ථකාමී බව සුරක්ෂිත බව, ඉවසිලිවන්ත බව (කරුණු 4කට ලකුණු 02)


(5)
- නල ජලය ලබා ගැනීම.
- විදුලි බලය ලබා ගැනීම.
- පොදු ප්‍රවාහන පහසුකම්.
- අපද්‍රව්‍ය බැහැර කරලීම.
- සෞඛ්‍ය සේවා පහසුකම්.
- වැසි ජලය බැස යාමට ක්‍රමවේදය
- සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට ඇති හැකියාව.

උදා : ක්‍රීඩා පිට්ටනි, ප්‍රජා ශාලා, විවිධ සමිති සමාගම් (කරුණු 2කට ලකුණු 02)

(6) පිහිතල පොලොව්, පෙට්ටි පොලොව්, යටිතල පොලොව් (කරුණු 2කට ලකුණු 02)

(7)
- සිප්පි වාටිය මැසීම.
- බ්ලැන්කට් මැස්ම මැසීම.
- බීක්කු මැසීම.
- ඉඳි කටු රේන්දය මැසීම.
- ඇඹරුම් වාටිය යෙදීම. (කරුණු 2කට ලකුණු 02)

(8)



(සුදුසු මෝස්තරයට ලකුණු 02)

(9)
- මවගේ රුධිර පරිමාව වැඩි වීම.
- කලලයේ රුධිර නිෂ්පාදනය.
- කලලයේ අක්මාවේ යකඩ තැන්පත් කිරීම සඳහා.
- ප්‍රසූතියේ දී සිදුවන රුධිර වහනය නිසා. (ලකුණු 02)

(10) පසු ළමා විය, මුල් යොවුන් විය (ලකුණු 02)

(මුළු ලකුණු 20)

(02) (i)
- කපු රෙදි වලින් නිෂ්පාදිත රෙදි වර්ගයක් වීම.
- සිනිඳු බවකින් හා මෘදු බවකින් යුතු වීම.
- නිතර සේදිය හැකි වීම.
- සේදීමේ දී හා මැදීමේ දී ඉහළ උෂ්ණත්වයකට භාජනය කළ හැකි වීම.
- දහඩිය උරා ගැනීමට හැකි වීම. (කරුණු 3කට ලකුණු 03)

(ii)
- වැටීමකට ලක් වූ විට ඇතුළත බෝතලය නොබිඳීම.
- ක්‍රමවත් බවක් හා අලංකාරයක් ලැබීමට.
- අපතේ යන දෙයින් ප්‍රයෝජනයක් ලබා ගත හැකි වීම.
- නිර්මාණය කෙරෙහි සිත යොමු කිරීම තුළින් මානසික තෘප්තියක් ලැබීම.
- විවේකය ඵලදායී ලෙස ගත කිරීමට හැකි වීම. (කරුණු 3කට ලකුණු 03යි)

(iii) (a) සෙ. මී. 23

(b) සෙ. මී. 52

(c) සෙ. මී. 29

(d) සෙ. මී. 04 (කරුණු 4කට ලකුණු 04)

(මුළු ලකුණු 10)

(03) (i) ප්‍රෝටීන් පරිපූරණය යනු ධාන්‍ය හා මාෂ භෝග 3:1 අනුපාතයට ආහාරයට එකතු කර ගැනීමෙන් ශරීරයට අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල ප්‍රමාණවත් ව සිරුරට ලබා ගැනීමයි.

(ලකුණු 03)

(ii)
- උසින් අඩු මල් යොදා ගැනීම.
- සුවඳ නොවිහිදෙන මල් වීම.
- ස්වාභාවික මල් වීම.
- පැතුරුණු මල් සැකසුමක් වීම. (කරුණු 03කට ලකුණු 03)

(iii) (a) සාපේක්ෂ වශයෙන් දෛනිකව වැඩි ප්‍රමාණයක් අවශ්‍යවන පෝෂ්‍ය පදාර්ථ මේ නමින් හැඳින්වේ. කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන් හා මේද මෙයට නිදසුන් ලෙස දැක්විය හැක.

(b) ආහාර සැකසීමේ දී ආහාරයේ ගුණාත්මක ලක්ෂණ දියුණු කිරීම සඳහා බාහිරව එකතු කරන ද්‍රව්‍ය ආහාර ආකලන ලෙස හැඳින් වේ. වර්ණ කාරක, රස කාරක, පරිරක්ෂණ කාරක, සුවඳ කාරක මීට ඇතුලත් ය. (ලකුණු 02 බැගින් 04)

(මුළු ලකුණු 10)

(04) (i)
- ප්‍රධාන මේස ඇතිරිල්ලට ආහාර වැටීමෙන් සිදුවන අපවිත්‍ර වීම වැළැක්වීම.
- මේසය මත ඇති උපකරණ ලිස්සා යාමේ අවධානම අවම කිරීම.
- කෑම මේසයට අලංකාරයක් එකතු කිරීම. (ලකුණු 03)

(ii) සීනි - ජෑම්, කෝඩියල්

ලුණු - මාළු, දෙහි, බිලිං, අමු අඹ

විනාකිරි - සෝස්, චට්නි (ලකුණු 03)

(iii) (a) අත් ගැසීම

මෙමගින් පිටි මිශ්‍රණයට වාතය ඇතුළුවීම නිසා එක් කළ යීස්ට් ක්‍රියාත්මක වී $Co_2$ වායුව මුදා හැරේ. එම නිසා පිටි මිශ්‍රණය පිපීම සිදු වේ.

(b) පදම් කිරීම

පෙර පිළියෙල කිරීමේ ක්‍රමයකි. මස්, මාළු හා එළවළු වර්ග සඳහා මේ ක්‍රමය යොදා ගනී. ආහාරවලට රස කාරක කුළු බඩු එකතුකර ටික වේලාවක් තැබීම නිසා එම ද්‍රව්‍ය ආහාර තුළට විසරණය වේ. එමගින් ආහාරයේ, රසය, වයනය, සුවඳ දියුණු වේ.

(ලකුණු 04)

(05) (i) භෞතික සම්පත් - මුදල්, ඉන්ධන, ජලය, ඉඩකඩ, දේපල හා ද්‍රව්‍ය, ප්‍ර/ජා පහසුකම්

භෞතික නොවන සම්පත් - කාලය, විදුලිය

භෞතික සම්පත් 04ක් සඳහා (ලකුණු 02)

භෞතික නොවන සම්පත් 02 ලියා ඇත්නම් (ලකුණු 01)

(මුළු ලකුණු 03)

(ii) කාලය

සීමිත සම්පතකි. ගතවූ කාලය නැවත ලබාගත නොහැකි බැවින් විවිධ කාර්ය සඳහා කාලය මනාව සැලසුම් කරගත හැකි වේ. කාලය සංවිධානය කිරීමෙන් සියළු කටයුතු මග නොහැරීමෙන් ඉටුකරගත හැකිය. ජීවිතය විවේකීව හා ප්‍රයෝජනවත්ව අසහනයෙන් තොරව සතුටින් ගත කිරීමට හේතු වේ. (ලකුණු 03)

(iii) දැනුම - ගෘහ ආර්ථික විද්‍යාව විෂයේ දී උගත් සම්පත් පාඩම් ඇසුරින් පාඩම් ඇසුරින් ලබාගත් දැනුම භාවිතය

කුසලතා - දක්ෂතා අනුව සිසුන්ට වැඩ පැවරීම.

ආකල්ප - යහපත් ආකල්ප වලින් හෙබිව සංවිධානය.

ශ්‍රමය - කායික හා මානසික ශක්තීන් මෙහෙයවමින් උත්සව කටයුතු සංවිධානය

(කරුණු 04ට ලකුණු 04)

(06) (i) යොවුන් විය යනු, අවුරුදු 10 සිට අවු. 19 තෙක් කාලයයි. මෙය අවධි තුනකින් සමන්විතය.

1. අවු. 10 - 13 - මුල් යොවුන් විය
2. අවු. 14 - 16 - මැද යොවුන් විය
3. අවු. 17 - 19 - පසු යොවුන් විය (ලකුණු 03)

(ii) අධිරෝපණය යනු,
සංසේචනය වීමත් සමග සෛල බෙදීම ආරම්භ වේ. සෛල බෙදීම (විභජනය) නිසා සෛල පොකුරක් ලෙස පැලෝපීය නාළය ඔස්සේ ගර්භාෂය කරා පැමිණේ. ගර්භාෂයේ ඇතුළු ආස්තරය මත එන්ඩොමෙට්‍රියම (අන්තඃජදය) තුළ මෙම සෛල පොකුර ගිලී සවි වේ. මෙය අධිරෝපණයයි. (ලකුණු 03)

(iii) පිළිතුරට අනුව ලක්ෂණ 2කට අදාළව ( 161) පිටුව (ලකුණු 04)

(07) (i) පිළිතුරට අනුව (ලකුණු 03)

(ii) පිළිතුරට අනුව (ලකුණු 03)

(iii) (a) යුක්තානුව
පරිණත ඩිම්බයක්, ශුක්‍රාණුවක් සමග පැලෝපීය නාලය තුළදී එක් වී සංසේචනය වේ. මෙම සංසේචිත ඩිම්බය යුක්තානුවයි. (ලකුණු 02)

(b) පෙකිණිවැල
මව හා දරුවා අතර සම්බන්ධය ඇති කරනුයේ පෙකිණිවැලෙනි. මවගෙන් දරුවාට පෝෂණය ලබා දීම, ප්‍රතිශක්තීකරණය ලබා දීම, රුධිරය ලබා දීම පෙකිණිවැල හරහා සිදුවේ. (ලකුණු 02)